විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක: 11/2021

ඔබේ අංකය / உமது இல. / Your No. } .........................

දිනය / திகதி / Date } 2021.09 10

ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>ආබාධිත ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හා වැන්දඹුවන්ට/ වැන්දඹු පුරුෂයන්ට රණවිරු සුරකුම් දීමනාව හිමිගැන්වීම</u>**

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2017 මගින් ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට හා මියගිය ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට රණවිරු සුරකුම් දීමනාව හිමිගැන්වීමට අදාළව උපදෙස් නිකුත් කර ඇත.

02. එම චක්‍රලේඛයේ (i), (ii) හා (iii) අනු වගන්ති යටතේ සුදුසුකම් ලැබූ ආබාධිත ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ට MOD/DEF/GS/SALW/4/SLA(I) හා 2019.09.24 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව 2019.09.24 දින සිට සහ වැන්දඹු බිරින්දෑවරුන්ට/ වැන්දඹු පුරුෂයන්ට MOD/01/2021 හා 2021.05.18 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව 2021.04.27 දින සිටත් ස්ථාවර මාසික දීමනාව හිමිගැන්වීම අනුමත කර ඇත. ඒ අනුව ඉහත දිනයන් හි සිට සුරකුම් දීමනාව හිමිගැන්වීම නතර කර ඇත.

03. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත විවිධ පරිපාලන දෝෂ හේතුවෙන් 2019.09.24 දිනට ප්‍රථම සුරකුම් දීමනා සඳහා අයදුම්පත් යොමු කිරීමට නොහැකි වූ ආබාධිත හමුදා සාමාජිකයින් හා 2021.04.27 දිනට ප්‍රථමව සුරකුම් දීමනා සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වූ මියගිය හමුදා සාමාජිකයින්ගේ වැන්දඹුවන් / වැන්දඹු පුරුෂයන් සඳහා ද හිඟ සුරකුම් දීමනාවකට හිමිකම පවතින අතර එම හිඟ මුදල් ගෙවීම සඳහා පහත උපදෙස් නිකුත් කරනු ලැබේ.

04. ඉහත විධිවිධාන යටතේ සුරකුම් දීමනාව හිමිගැන්වීම සඳහා සුදුසුකම් ලබන පිරිස සඳහා ආබාධිත ත්‍රිවිධ හමුදා සාමාජිකයින් හා මියගිය ත්‍රිවිධ හමුදා සාමාජිකයින් වයස අනුව අවු.55 දී ලබන වැටුප් විස්තර සමඟ

සුරකුම් දීමනා ගෙවීම සඳහා ඉල්ලීමක් ත්‍රිවිධ හමුදාවන් විසින් විශ්‍රාම වැටුප් ගෙවන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමුකළ යුතුය. ප්‍රාදේශීය ලේකම් විසින් රණවිරු සුරකුම් දීමනාවේ හිඟ ගෙවීම හිමිගැන්වීම සඳහා අයදුම්පත් AR යටතේ යොමුකළ යුතුය. එහිදී Reason ලෙස Forces Surekum Allowance Arrears තෝරා ගත යුතුය. වයස අවු.55 දී විශ්‍රාම වැටුප් සංශෝධනය කල ප්‍රදාන පත්‍රය හා ගණනය කිරීමේ ලේඛන ඇමුණුම් ලෙස ඇතුළත් කල යුතුය.

05. රණවිරු සුරකුම් දීමනාව ගෙවූ පසු, ඒ පිළිබඳ වාර්තාවක් විශ්‍රාම වැටුප් ගොණුවට ඇතුළත් කර තිබිය යුතු අතර එහි පිටපතක් විශ්‍රාමිකයාට ද ලබාදිය යුතුය.

06. රණවිරු සුරකුම් දීමනා ගෙවීමට 2021 වර්ෂයෙන් පසු ප්‍රතිපාදන නොමැති බැවින් 2021-12-31 ට පෙර සියලු හිඟ ගෙවීම් සිදු කර අවසන් කරන ලෙසද කාරුණිකව දන්වනු ලැබේ.

ඒ.ජගත් ඩී.ඩයස්

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

| | | |
|---|---|---|
| 01. | ජනාධිපති ලේකම් | - කරු.දැ.ගැ.ස. |
| 02. | අග්‍රාමාත්‍ය ලේකම් | - කරු.දැ.ගැ.ස. |
| 03. | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස. |
| 04. | ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය | - කරු.අ.ක.ස |
| 05. | ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස. |
| 06. | විගණකාධිපති | - කරු.දැ.ගැ.ස හා අ.ක.ස. |